# අත්දැකීම් පාදක කරගනිමින් පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණකරණයෙහි යෙදීම

පරිසරය අප ජීවිතයේ කොටසකි. එහි ඇති ජීවී අජීවී සියල්ලම කෙරෙහි අප ලෙන්ගතු විය යුතුය. ස්වාභාවික වස්තු උපයෝගී කරගෙන නිර්මාණාත්මක මෙන්ම වෙනත් කලා නිර්මාණ ද බිහි කළ හැක.

**ක්‍රියාකාරකම ඃ**

ඔබ සිටිනා තැනින් පිටතට ගොස් පරිසරයේ ස්වාභාවික වස්තු හඳුනා ගත යුතුය. එම වස්තූන් හොඳින් රසවිදිය යුතුය.

- හිරු පායන දර්ශනයක්
- සඳ පායන දර්ශනයක්
- වැසි සහිත අවස්ථාවක්
- සුළං සහිත අවස්ථාවක්







තමා දුටු හා තමා රසවිඳි වස්තූන් පිළිබඳ අනෙකුත් සාමාජිකයන් හා අදහස් හුවමාරු කරගත හැක. ඔබගේ ඇසට පරිසරයේ විවිධ චලන, රිද්ම රටා සහ ද්‍රව්‍යයන් අසුවිය යුතුය. පරිසරයට අනුගත

වෙමින් අපගේ ජීවන රටාව අප ගොඩනගා ගත යුතුය. පරිසරය අප ජීවිතයේ කොටසක් බව මෙහිදී අපට පසක් වේ.

එසේ ස්වාභාවික පරිසරය මත ගොඩනැගෙන සිද්ධි පිළිබඳ හොඳින් අධ්‍යනය කිරීම මගින් එකී පාරිසරික ස්වාභාවයන් අපට අනුකරණය කළ හැකිය. මේවා අනුකරණය නිර්මාණාත්මක වේ. එය නිර්මාණශිලීව, ස්වාභාවිකව සිදුවීම් සන්නිවේදනය වන අයුරින් ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කළ හැකිය.

මෙකී ස්වාභාවික සිද්ධි අධ්‍යනය මගින් චිත්‍ර, කවි, රචනා, නාට්‍ය නිර්මාණ අතීතයේ පටන් සිදු වන දෙයකි. එවැනි නිර්මාණ ඔබ රසවිඳ ඇත.

උදාහරණ ඃ

- අක්කෙ අක්කෙ අර බලන්නකෝ
- කියන්න සුළගේ
- වළාකුළින් බැස සමන් කුලත් වැද
- වෙසක් කැකුළු


වළාකුලින් බැස

ගායනය: සුනිල් ශාන්ත
සංගීතය: සුනිල් ශාන්ත
පද රචනය: අරිසෙන් අහුබුදු

වළාකුලින් බැස සමන් කුළත් වැද
එලෝ බලා යනවා
අනේ මගෙන් වැඩ ගනිවූ ගනිවූ
හඬ හඬා ඔහේ යනවා

දැවේ දැවේ බිම් දි දී රදස් දූම්
බැලූ බැලූ හැමතේ
යවවූ යවවූ මා එහේ මෙහේ හා
ගිමන් නිවා පොළොවේ

වළාකුලින් බැස.../
දැවේ දැවේ බිම් වැදී රජස් දූම්...

එදා රටේ මේ දනෝ තැතින් මා
තැනින් තැනේ රඳවා
මගෙන් වැඩක් ගෙන මටත් වැඩක් කොට
ලොවේ නමක් තැබුවා

වැඩක් නොගත් දිය හඬා දොඩා මේ
මුවේ බලා යනවා
හැපී සිඳී සිඳු තෙරේ වැදී කරදියෙන්
එලෝ යනවා

වළාකුලින් බැස.../

www.lklyrics.com


ලෝ අඩ නින්දේ

ගායනය: C T ප්‍රනාන්දු
සංගීතය: C T ප්‍රනාන්දු
පද රචනය: සුසිල් සේනාධීර

ලෝ අඩ නින්දේ මේ රෑ යාමේ
සඳ රැස් වතුරේ තිමිදෙන්නේ
රන් තරු බැබලේ නිල් ආකාසේ
ලස්සන මල් වාගේ

කිරල ගසේ ගෙඩි දිය මත වැටිලා
පහලට බැස යයි දිය ඇල්ලේ
නාමල් පිපිලා නැලවෙනී සුළඟේ
සුවඳ හමා දසතේ
සෝබන මේ නදියේ....සෝබන මේ නදියේ
සඳරැස් පැතිරෙන්නේ....

ලෝ අඩ නින්දේ ...

ඈල් කෙතකින් එන දැටියක ගේ හඬ
දැන් දැන් මා හද නලවන්නේ
මහ රෑ හින්දයි ඇයගෙ පිදී හඬ
දසතම පැතිරෙන්නේ
කවුරුද ඇල්හේනේ....කවුරුද ඇල්හේනේ
ගී හඬ පතුරන්නේ....

ලෝ අඩ නින්දේ...

www.lklyrics.com

ආදී ගීත ගායනයේ දී පරිසරයේ සුන්දරත්වය ඉතා අපූර්ව ආකාරයෙන් රචනා වී ඇත. මේ ආකාරයට පාරිසරික සිද්ධි ඇතුළත් නාට්‍ය ද ඔබට නිර්මාණය කළ හැක. එහි දී තම අත්දැකීම නිවැරදිව නිර්මාණයට එක්කරගත යුතුය.මෙමගින් ආරම්භය මෙන්ම නාට්‍ය නිමාව සාර්ථකව කරගත හැකිය. ඒ ආකාරයට ස්වාභාවික වස්තු ඇසුරු කොටගෙන නිර්මාණකරණයේ යෙදෙමු.

## ක්‍රියාකාරකම ඃ

- හිරු පෑයීම සඳ පෑයීම වැනි අවස්ථා නිර්මාණශීලීව අනුකරණය කරන්න
- "මුහුදු වෙරළේ සැඳෑවක්" යන්නෙන් කවි පංතියක් නිර්මාණය කරන්න